# විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ලබාදීම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබන විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ශ්‍රී ලංකාව තුළ දී ඕනෑම අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම පිණිස තම දේශීය බැංකු ඒකකවලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

2. විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරනු ලබන ණය සහ අත්තිකාරම්

2.1 ණය ආපසු ගෙවීම සඳහා ණය ගැනුම්කරු සතුව විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීම් පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ යුතු අතර බලයලත් වෙළෙඳුන් විසින් ණය ගැනුම්කරුගේ විදේශ රැකියාව හෝ ඔහුගේ/ඇයගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි පවතින ශේෂයන් සැලකිල්ලට ගනිමින් ඔහුට/ඇයට විදේශ ව්‍යවහාර මුදලින් ණය ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳ ව තක්සේරු කර සෑහීමට පත්විය යුතුය.

2.2 විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබා දී ඇති නේවාසික හෝ වාණිජ දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් (එනම්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සහ ශ්‍රී ලංකාව තුළ දේපළ විකිණීමේ ව්‍යාපාරයෙහි නිරත වන අක්වෙරළ බැංකු ඒකක ගිණුම් හිමියන්) විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලට ප්‍රතිෂ්ඨා ණය මුදල් මාරු කරන ලෙස ණයගැතියා ඉල්ලා සිටින්නේ නම් මිස ණයගැතියාට ප්‍රතිෂ්ඨාපන ණය මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් නිදහස් කරනු ලැබිය යුතුය.

3. ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරනු ලබන ණය සහ අත්තිකාරම්

3.1 ණය මුදල ආපසු අයකර ගැනීමට ඇති අවධානම, විශේෂයෙන්ම, ණය ගැනුම්කරුගේ විදේශ සේවා නියුක්තියට අදාළව ඔහුගේ/ඇයගේ ණය ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳව තක්සේරු කොට සෑහීමට පත්වීමෙන් පසුව ශ්‍රී ලංකා රුපියල්වලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ යුතු ය.

3.2 ණය ගැනුම්කරු හට ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රතිෂ්ඨා ණය මුදල නිදහස් කරනු ලැබිය යුතුය.

4. විදේශ ව්‍යවහාර මුදලින් සහ ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කෙරෙන ණය සහ අත්තිකාරම්වල කාල සීමාව, සුරැකුම, ආපසු ගෙවීම හෝ ගෙවීම පැහැර හැරීමක දී විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා රුපියල්වලින් ණය අයකර ගැනීම නියෝග ප්‍රකාරව විය යුතුය.

5. අනෙකුත් කොන්දේසි

5.1 ණය මුදල සම්පූර්ණයෙන් පියවන තෙක්, බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල ප්‍රදානය කළ අවස්ථාවේ දී ලබාගන්නා ලද ලේඛනගත සාක්ෂි, ඕනෑම ව්‍යවස්ථාපිත වාර්තා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් ඉක්මවා පවත්වාගෙන යා යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් පිය වූ පසු, අදාළ ලේඛනගත සාක්ෂි, ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය පරිදි පවත්වාගෙන යා යුතුය.

5.2 බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I පරිදි මෙම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් පිළිබඳව මාසික වාර්තාවන් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

5.3 අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ප්‍රදානය කරන ලද ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වූ වගන්ති සහ කොන්දේසි සහ ඒවා පියවාගැනීම ද මෙම නියෝග ප්‍රකාරව බලාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2017 අංක 10 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I

# විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම පිළිබඳ ව මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : ..............................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..............................

| ණය වර්ගය | ණය ගැනුම්කරුගේ නම | ණය ප්‍රදානය කරන ලද දිනය | ණය කාලසීමාව | ප්‍රදානය කරන ලද මුදල | ණය ලබාදීමේ අරමුණ | ඇප සුරැකුමෙහි ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය (විදේශ ව්‍යවහාර මුදල් වර්ගය සඳහන් කරන්න) | | | | | | |
| ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කරන ලද ණය | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම ..............................

අත්සන ..............................

දිනය ..............................

අනුකූලතා නිලධාරියාගේ නම ..............................

අත්සන ..............................

දිනය ..............................